තොරතුරු මාසිකය

# විමර්ශන

**2023 නොවැම්බර්**
**ජනතා විමුක්ති පෙරමුණේ**
**අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි.**

**ලෝකය වෙනස් කිරීමට වෙනස් වෙමු!**

# අයවැය වියදම්

**ශ්‍රී ලංකාවේ 2024 වර්ෂය සඳහා අයවැය ඉදිරිපත් කිරීම වෙනදා ලෙසම සුපුරුදු පරිදිම ඉදිරිපත් කිරීමට නියමිතය. බංකොලොත්වූ ධනේශ්වර ආර්ථිකයක අයවැයක් යනු, රට පත්ව ඇති ආර්ථික අර්බුදයෙන් ගොඩගත හැකි හෝ අවම වශයෙන් එම අර්බුදය විසඳන දිශාවට යොමුවන ආකාරයේ එකක් විය යුතුය. එහෙත්, දශක ගණනාවක ඇති අත්දැකීම් අනුව මේ වසරේද අයවැය කලින් වසරවලට කිසිදු වෙනසක් වීමට ඉඩක් නැත. එය තව දුරටත් ආර්ථිකය සහ ජන ජීවිතය අර්බුදයට යවන අයවැයක් වනවාට කිසිදු සැකයක් නැත.**

අයවැයක් ඉදිරිපත් කිරීමේදී රජයක් මූලික වශයෙන් බලාපොරොත්තු වන අරමුණු කිහිපයක් තිබේ.

1. සම්පත් උපයෝජනය - ඒ අනුව රටේ සම්පත් සමාජ සහ ආර්ථික ප්‍රතිලාභ ලැබෙන ආකාරයට බෙදීයාමට කටයුතු කිරීම එක් අරමුණකි.
2. නිෂ්පාදකයන් දිරිමත් වන ආකාරයට ආර්ථික ක්‍රියාකාරකම් හැසිරවීම. ඒ යටතේ අවශ්‍ය බදු සහන සහ සහනාධාර ප්‍රතිපත්ති ක්‍රියාවට නැඟිය යුතුය.
3. සාධාරණ ආදායම් සහ ධනය බෙදීයාමක් අයවැය හරහා ඉටු කරගත හැකිය.
4. ආර්ථික ස්ථායීකරණයක් ලබා ගැනීම තවත් අරමුණකි. විශේෂයෙන්ම බංකොලොත්වූ ආර්ථිකයකට මෙම අරමුණ ඉතා වැදගත් වේ.
5. රාජ්‍ය ආයතන කාර්යක්ෂම සහ ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහාද අයවැය පාවිච්චි කරනු ලැබේ.
6. ආර්ථික වර්ධනයක් අත්පත් කර ගැනීමත් අයවැයෙහි ප්‍රමුඛ කටයුත්තකි.
7. ප්‍රාදේශීය විෂමතාවන් ඉවත්වන ලෙස ආර්ථික කටයුතු හැසිරවීමද අයවැයෙහි ප්‍රධාන අරමුණකි.

ඉහත සඳහන් කරන ලද අයවැය අරමුණු මෙවරද ළඟාකරගත නොහැකි බවට කිසිදු තර්කයක් නොමැත. මේ වන විටත් 2024 වර්ෂයට අදාළව විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති අතර, එහි වියදම් සාරාංශය පහතින් දැක්වේ.

**2024 අයවැයෙහි වියදම් සාරාංශය ( රුපියල් බිලියන)**

| විස්තරය | වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 2024 | 2023 | 2022 | 2021 |
| පුනරාවර්තන වියදම් | 2720 | 2445 | 1954 | 1699 |
| පොලී ගෙවීම් | 2,634 | 2,189 | 1,565 | 1,048 |
| ප්‍රාග්ධන වියදම් | 1,209 | 1,220 | 953 | 774 |
| මුළු වියදම | 6,563 | 5,845 | 4,473 | 3,522 |
| කලින් වසරට වඩා වැඩිවීමේ ප්‍රතිශතය | 12.2 % | 30.6 % | 27.0% | |

ඉහත වගුවට අනුව පසුගිය වසර දෙකට වඩා වියදම ඉහළ යාම අඩුවී ඇති අතර, මෙයට ප්‍රධාන ලෙසම හේතුවන්නේ ආර්ථිකය හැකිළීමයි. එහෙත්, මෙවර අයවැයෙන් රුපියල් බිලියන හයදහසකට වඩා වියදම් කිරීමට රජය බලාපොරොත්තු වේ. මෙම රුපියල් බිලියන හයදහස් පන්සියය රජයට උපයා ගැනීමට සිදුවන්නේ ඍජු බදු සහ වක්‍ර බදු හරහාය. එසේ බදු හරහා උපයා ගන්නා ආදායම වියදම් කිරීමට බලාපොරොත්තුවන අංශ කිහිපයක් පහත දෙවන වගුවෙන් දැක්වේ:

පහත වියදම් වර්ගීකරණයට අනුව ආණ්ඩුව වැඩිපුරම මුදල් වෙන්කර ඇත්තේ, මුදල් අමාත්‍යාංශයටය. එය රුපියල් බිලියන 240ක වැඩි වීමකි. එහෙත්, අධ්‍යාපනයට වැඩිකර ඇත්තේ, රුපියල් බිලියන පහක් පමණි. ඒ අතර කාන්තා, ළමා කටයුතු සහ සමාජ සුභසාධනයේ වියදම් අඩකින් පමණ අඩුකර ඇති අතර, එය රුපියල් බිලියන 77කි.

අනෙක් අතට ලංකාවේ ආණ්ඩුව ගතවූ වසර තුළ 2023 වර්ෂයේ ජනවාරි සිට ජූලි දක්වා රාජ්‍ය ආදායම ලෙස ලබාගෙන ඇත්තේ රුපියල් බිලියන 1,516කි. ඒ අනුව 2023 වසරේ සමස්ත ආදායම ලෙස ඉදිරි මාස 05 වෙනුවෙන් රුපියල් බිලියන 1,500 ක් උපයා ගත්තද, මුළු ආදායම රුපියල් බිලියන 3,000 සීමාවට ළඟාවන්නේ අසීරුවෙනි. එසේ තිබියදී, රුපියල් බිලියන හයදහස් පන්සියයක් උපයා ගන්නේ කෙසේද යන්න ගැටලුවකි. එලෙසම 2023 වසරේ ජනවාරි සිට ජූලි දක්වා මුළු පුනරාවර්තන වියදම රුපියල් බිලියන 2,674ක්වී ඇති අතර, ඒ මත වසරට අදාළ පුරෝකථනය කළ හැකි අගය රුපියල් බිලියන 4,500ක් පමණ වේ. එසේ තිබියදී, 2024 දී පුනරාවර්තන වියදම් ලෙස රුපියල් බිලියන 5,354ක් අයවැයෙන් වෙන් කිරීම සලකා බැලිය යුතු කරුණකි. එනිසාම මේ සියලු කාරණා සැලැකිල්ලට ගත් කල අයවැයක් මගින් රටක් බලාපොරොත්තු වන දේ ලබා ගත හැකිද යන්න ගැටලුවකි.

| | රුපියල් බිලියන | | |
|---|---|---|---|
| විස්තරය | 2024 | 2023 | වෙනස |
| ආරක්ෂක | 424 | 410 | 14 |
| සෞඛ්‍යය | 410 | 323 | 88 |
| අධ්‍යාපනය | 237 | 232 | 5 |
| මුදල් | 791 | 551 | 240 |
| කාන්තා, ළමා කටයුතු සහ සමාජ සුභසාධන | 75 | 152 | -77 |
| ප්‍රවාහන සහ මහාමාර්ග | 404 | 375 | 29 |

# මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත Online Safety Bill කා සදහාද?

**මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත හෙවත් Online Safety Bill ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ 2023 සැප්තැම්බර් 15 වන දිනයි. මෙම පනත ත්‍රස්ත විරෝධී පනත මෙන්ම අතිශය මර්දනකාරී, ප්‍රජාතන්ත්‍ර විරෝධී පනත් කෙටුම්පතකි.**

## පනතෙහි අරමුණු

මෙම පනත මඟින් මෙය ගෙන ඒමේ අරමුණු ලෙස දක්වා තිබුණේ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳව කොමිෂන් සභාව පිහිටුවීම, ශ්‍රී ලංකාව තුළ සිද්ධියක් පිළිබඳ ඇතැම් ප්‍රකාශ මාර්ගගත ලෙස සන්නිවේදනය කිරීම තහනම් ලෙස විධාන සැලැසීම, තහනම් කාර්යය සඳහා මාර්ගගත ගිණුම් සහ ව්‍යාජ මාර්ගගත ගිණුම් භාවිත කිරීම වැළැක්වීම, ශ්‍රී ලංකාව තුළ තහනම් කාර්යය සඳහා භාවිත කරනු ලබන මාර්ගගත ස්ථාන හඳුනා ගැනීම සහ ප්‍රකාශයට පත්කිරීම සඳහා විධාන සැකසීමට, සිද්ධියක් පිළිබඳව අසත්‍ය ප්‍රකාශ සන්නිවේදනය කිරීම සඳහා මුදල් සැපයීම සඳහාත් අනෙකුත් ආධාර ලබාදීම මැඩපැවැත්වීම හෝ ඉහත කාරණා සම්බන්ධ හෝ ඊට ආනුෂාංගික කාරණා සඳහා විධාන සැලැස්වීම යනාදියයි.

## කොමිෂන් සභාව

මෙම පනත් කෙටුම්පත තුළින් ප්‍රධාන ලෙසම බලය කේන්ද්‍ර කර ඇත්තේ මින් පිහිටවනු ලබන කොමිෂන් සභාව වෙතය. තොරතුරු තාක්ෂණය, නීතිය, පාලනය, සමාජසේවා, පුවත්පත් කලාව, විද්‍යාව හා තාක්ෂණය හෝ කළමනාකරණය යන ක්ෂේත්‍ර එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සම්බන්ධයෙන් සුදුසුකම් හා පළපුරුද්ද සහිත සාමාජිකයන් පස් දෙනෙකුගෙන් මෙම කොමිෂන් සභාව සමන්විත වේ. එමෙන්ම මෙම සාමාජිකයන් පස්දෙනා පත්කිරීම සිදුකරනු ලබන්නේ ජනාධිපතිවරයා විසින් වන අතර, හේතු දක්වා යම්කිසි සාමාජිකයකු එම ධුරයෙන් ඉවත් කිරීමටද බලය ඇත්තේ ජනාධිපතිවරයාටය. එමෙන්ම කොමිෂන් සභාවේ සභාපතිවරයා පත්කිරීමට බලය ඇත්තේද ජනාධිපතිවරයාට වන අතර, කොමිසමේ සාමාජිකයන් 05 දෙනාගෙන් එක් අයකු සභාපති ලෙස පත් කළ යුතු වේ. ජනාධිපතිට ලැබෙන මෙම බලතල හරහා මෙම කොමිෂන් සභාව කිසිවිටෙකත් අපක්ෂපාතී හෝ ස්වාධීන හෝ නොවන බව මෙන්ම මෙම නීති තමන්ගේ විරුද්ධ පාර්ශ්වයන් කෙරෙහි අවභාවිත කිරීමෙහි ඉහළ සම්භාවිතාවක්ද පවතින බව විද්‍යමාන වෙයි. ජනාධිපති වෙත යවනු ලබන ලිපියක් මඟින් මෙහි කිසියම් සාමාජිකයකු හට ස්වකීය ධුරයෙන් ඉවත්වීමද සිදු කළ හැකිය. සරලව ගත් කල මෙම කොමිෂන් සභාවේ සියලු බලතල කේන්ද්‍රීය වී ඇත්තේ, ජනාධිපති වෙතයි.

## කොමිෂන් සභාවේ බලතල

මෙම පනත මඟින් පිහිටුවනු ලබන කොමිෂන් සභාවට සුවිශේෂී බලතල රාශියක් හිමිවේ. එනම්, සමාජ මාධ්‍ය වේදිකා ලියාපදිංචි කිරීම, සමාජ මාධ්‍ය සඳහා ආචාර ධර්ම හඳුන්වා දීම, පනත යටතේ වැරැදි ලෙස ගැනෙන සන්නිවේදන නතර කරන ලෙස එම සන්නිවේදන නිකුත් කරන පුද්ගලයන්ට විධාන නිකුත් කිරීම, සන්නිවේදන නිකුත් කරන තැනැත්තන්ට, අන්තර්ජාල සේවා සපයන්නන්ට සහ අන්තර්ජාල අතරමැදියන්ට විධාන නිකුත් කිරීම, තහනම් ප්‍රකාශ නිකුත් කරන මාර්ගගත ස්ථාන අක්‍රිය කරන ලෙස අන්තර්ජාල සේවා සපයන්නනට සහ අන්තර්ජාල අතරමැදියන්ට දැනුම් දීම යන සියලුම ක්‍රියාවන් පාලනය කිරීමේ සහ දඬුවම් නියම කිරීමේ අසීමාන්තික සහ නැවත ප්‍රශ්න කළ නොහැකි විශේෂ බලතල හිමි වේ. කොමිසමේ යම්කිසි වැරැදි තීන්දුවක් මඟින් අගතියට පත් වුවහොත්, කිසිම විටෙක කොමිසමට හෝ එහි සාමාජිකයකුට විරුද්ධව කිසිදු අපරාධ හෝ සිවිල් හෝ නඩුවක් ගොනු කිරීමට හැකියාවක් ලබෙන්නේ නැත. එනම්, මෙහි වැරැදි තීන්දුවකට එරෙහිව පුරවැසියන්ට කිසිදු අධිකරණ ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වීමට ඉඩප්‍රස්ථාවක් ලැබෙන්නේ නැත.

■ තීරණයක් ගැනීමේදී කොමිෂන් සභාවේ මුළු සමාජික සංඛ්‍යාවෙන් බහුතරයෙන් මෙම කොමිෂන් සභාවට තීරණය ගත හැකිය.

■ එබැවින්, සාමාජික සංඛ්‍යාව 5 දෙනකු ලෙස සටහන් වුවද, සමාජිකයන් 3 දෙනකුගෙන් මෙම කමිටුව කැඳවිය හැකිය. ඒ අනුව සමාජිකයන් දෙදෙනකුගේ තීරණය බහුතරයේ තීරණය ලෙස මෙම කමිටුවට ගත හැකිය.

## ව්‍යවස්ථාවේ ඇති භාෂණයේ සහ ප්‍රකාශනයේ අයිතිය උල්ලංඝනය වීම

කෙසේ නමුත්, මෙම පනත මඟින් භාෂණයට හා ප්‍රකාශනයට ඇති අයිතිවාසිකම් දැඩි ලෙස උල්ලංඝනය කරනු ලබයි. ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන කොමිසම කිසිවිටෙකත් ස්වාධීන කොමිසමක් වන්නේ නැත. මෙම පනත මඟින් නිර්දෝෂීභාවයේ පූර්ව නිගමන අභියෝගවලට ලක් කිරීම සිදුවන බව දැකගත හැකිය. එනම්, අනෙක් පාර්ශ්වයේ කිසිදු කරුණු දැක්වීමකට හෝ පැහැදිලි කිරීමකට හෝ අවස්ථාව ලබා නොදී තීන්දු ප්‍රකාශයට පත් කිරීමට හැකියාවක් කොමිසම සතු නිසාය. මෙහි දක්වා ඇති තහනම් ප්‍රකාශ සම්බන්ධ වැරැදි නිශ්චිත නොවන නිසා ඊට පුළුල් අර්ථ ලබා දිය හැකි බැවින්, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට අනවශ්‍ය සීමාවන් පැනවීමද සිදු වේ. කොමිෂන් සභාවේ තීන්දු තීරණ පක්ෂග්‍රාහී වීමේ ඉහළම විභවයක් පවතී. මන්දයත්, මෙහි සාමාජිකයන් පත් කිරීම්, සභාපතිවරයා පත්කිරීම, ධුරයෙන් ඉවත් කිරීම් සිදු කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසින් වන නිසාය. සමාජ මාධ්‍ය වේදිකා ලියාපදිංචිය සිදු කිරීම කළ යුතු නිසා ඊට අවනත නොවන සමාජ මාධ්‍ය වේදිකා ශ්‍රී ලංකාවෙන් බැහැරවීම මගින් පුරවැසියන්ට තම අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස හා අවකාශය අවදානමටද මෙමඟින් ලක්වේ. මීට අනුව විදේශීය සමාගම් හරහා සිදු කරන බොට් ක්‍රියාකාරකම් තාක්ෂණික හේතු මත පැවැත්විය නොහැකි නිසා එම වරද සම්බන්ධයෙන් වගකීමට බැඳෙන්නේ මෙරට පුරවැසියන් පමණකි. එමෙන්ම අතීතයේ සහ වර්තමානයේ 'අයි.සී.සී.ආර්.ආර්.' (ICCPR) පනත ආණ්ඩු විසින් අවභාවිත කරන ආකාරයෙන්ම මෙම පනත් කෙටුම්පත් විධිවිධානද අවභාවිත කරමින්, තම විරුද්ධවාදීන් මර්දනය කිරීමට යොදා ගැනීමටද මෙහි අසීමාන්තික කැටිවුණ බලතල තුළින් අවස්ථාව සැලැසේ.

12 සිට 23 දක්වා වගන්තිවල තහනම් ප්‍රකාශ පිළිබඳව සඳහන් වේ. එය මෙම පනත් කෙටුම්පතෙහි වැදගත්ම වගන්ති වේ.

■ මෙම කෙටුම්පතෙහි 12 වන වගන්තියේ සඳහන් වන්නේ අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම මඟින් මහජන ආරක්ෂාවට, මහජන සාමයට, මහජන සෞඛ්‍යයට හා පන්ති අතර වෛරය අවුළුවන ප්‍රකාශ තහනම් ප්‍රකාශ ලෙසයි.

නමුත්, මෙහි ජාතික ආරක්ෂාව, මහජන සාමය, මහජන සෞඛ්‍යය යන වචනවලට අර්ථනිරූපණයක් ලබා දී නැහැ. එම නිසා මේවා පුළුල් පරාසයක් තුළ විහිදෙන විශාල ලෙස අවභාවිත කළ හැකි වචන වේ. මීට අනුව බාල ඖෂධ ගෙන්වීම ගැන පුවතක් අප සමාජ මාධ්‍යයේ පළ කළත්, එය මහජන සෞඛ්‍යයට තර්ජනයක් ලෙස ගෙන තහනම් ප්‍රකාශ ලෙස හැඳින්විය හැක.

මීට අනුව මෙම වරද සිදු කරන්නා වසර 5ක සිරදඬුවමකට හෝ දඩයකට හෝ එම දඬුවම් දෙකටම යටත් වන අතර, මේ වරදම දෙවන වර කළහොත් දඬුවම දෙගුණ වේ.

■ මෙම කෙටුම්පතෙහි 14 වන වගන්තියට අනුව ප්‍රකෝප කරවීමෙන්, කැරැලි ගැසීමේ වරද සිදු විය හැකි බවට චේතනාවෙන්ම හෝ ඒ බව දැන දැනම යම් අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම තුළින්;

(අ) කැරැලි ගැසීමක් සිදුවුණහොත්, අවුරුදු 05ක සිරදඬුවමක් හෝ දඩයක් හෝ ඒ දඬුවම් දෙකම.

(ආ) කැරැලි ගැසීමක් සිදුනොවුණහොත්, අවුරුදු 03ක සිරදඬුවමකට හෝ දඩයකට හෝ ඒ දඬුවම් දෙකටම යටත් වේ.

07 පිටුවට

# ජලය විකිණීමේ සැලැස්ම සහ ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය

**නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාවට නංවන රටක් ලෙස පැවැති ආණ්ඩු සහ පවතින ආණ්ඩුව රටේ ස්වාභාවික සම්පත් පවා මුදලට විකිණීමේ ක්‍රියාවලියක නිරත වීම යථාර්ථයක් වී තිබේ. 1997 පොදුජන එක්සත් පෙරමුණු පාලන කාලයේදී 'ජල කළමනාකරණ පනත' තුළින්ද, 2002-2004 කාලය තුළ පැවැති අගමැති රනිල් වික්‍රමසිංහගේ පාර්ලිමේන්තු කාලය තුළ ක්‍රියාවට නැඟුණු 'යළි පුබුදමු ශ්‍රී ලංකා' (Regaining Sri Lanka) වැඩසටහන තුළින්ද ජල පෞද්ගලිකකරණ ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීමට උත්සාහ ගත්තද, ජනතා විරෝධයන් හමුවේ එය හකුළා ගන්නා ලදී.**



දැන් එම සංවාදය මතුව ඇත්තේ, 2023 ජූලි 10 වැනි දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීම සඳහා අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද ලිපියට අනුව ය. නැවත ඒ සඳහා පනතක් සකස් කිරීමට කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බවත්, එම කටයුතු කරගෙන යාම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති, මහාචාර්ය සී. එම්. මද්දුමබණ්ඩාර මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් පත් කර ඇති බවත් එහි සඳහන් ය. ඒ අතර, පාරිසරික සහ දේශගුණික විපර්යාස පිළිබඳ ජනාධිපති උපදේශක එරික් සොල්හයිම් මෙම ක්‍රියාවලිය තුළ සිටීම ද අවධානයට ගත යුතු ය. එකී ජල කළමනාකරණ පනතක් සැකැසීමේ අවශ්‍යතාව පිළිබඳව සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර හවුල්කරුවන් ද උනන්දුවෙන් සිටින බව ද සඳහන් වේ.

ජලය කළමනාකරණය කළ යුතු බවට වන අරමුණු පැහැදිලි කිරීම සුපුරුදු පරිදි කාටත් පිළිගත හැකි ලෙසින් කරුණු පෙළගස්වනු ලැබ තිබේ. එහිදී පසුගිය දශකය තුළ ලොව පුරා පැවැතුණු උග්‍ර දේශගුණික විපර්යාසවලට ප්‍රමුඛව ලක්වුණු රටක් ලෙස ශ්‍රී ලංකාව හඳුනා ගනු ලැබ තිබේ. මෙරට වියළි කලාපයේ වර්ෂාපතනය අඩු වෙමින්, දැඩි නියං හට ගැනීම, තෙත් කලාපයේ වර්ෂාපතනය වැඩි වී ගංවතුර තර්ජන වැඩි වීම ඔවුන්ගේ නිරීක්ෂණයට භාජනය වී තිබේ. එනිසා පානීය, වාරි, බලශක්ති සහ සේවා අවශ්‍යතා සඳහා මෙරට සීමිත ජල සම්පත් ප්‍රශස්ත අයුරින් භාවිත කිරීමට ප්‍රතිපත්තියක් සැකැසීම ජාතික අවශ්‍යතාවක් ලෙසට කරුණු දක්වනු ලැබ තිබේ.

ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව පරිහරණය කෙරෙන මුළු ජල ප්‍රමාණය ඝන මීටර බිලියන 13කි. ඉන් සියයට 87ක් කෘෂි කර්මාන්තයට ද, සියයට 6ක් කාර්මික අංශය සඳහා ද, සියයට 6ක් පානීය ජලය සඳහා ද පරිහරණය කෙරේ. ලංකාවට වාර්ෂිකව ලැබෙන වර්ෂාපතනය ගංගා, ඇළ, දොල, වැව්, අමුණුවල රැඳෙන මතුපිට ජලය ද, භූගත ජලය ද සමස්තය ගත් කල ඝන මීටර 130කට ආසන්න ජල සම්පතක් පවතී. ගංගා 103ක් ඔස්සේ වාර්ෂිකව මුහුදට ගලා යන ජල කඳ අතිමහත් ය.

නිවැරැදිව නම් විය යුත්තේ, රට සමස්තයක් ලෙස සලකා තෙත් කලාපයේ ගංවතුර ඇති වන තරමට ලැබෙන මහා ජල කඳ වියළි කලාපයට බෙදාහැරීමේ විද්‍යාත්මක ක්‍රමවේද සැකැසීමට, කළමනාකරණයට සැලැසුම් සැකැසීම ය. නමුත්, ජල කළමනාකරණය යැයි ගෙන එන සෑම යෝජනාවකම හරය වනුයේ, දැනට පරිභෝජනය කෙරෙන ඝන මීටර බිලියන 13කට ආසන්න ජල සම්පත් කළමනාකරණයට සැලැසුම් සැකැසීමයි.

මීට සමාන්තරව විදුලිබල මණ්ඩලය කොටස් කර සමාගම්වලට විකිණීමේ සැලැසුම සියුම්ව විමසා බැලීම වටී. විදුලි බලාගාර පෞද්ගලික අංශයට විකුණූ පසු ඔවුන් පෙර පරිදි ජලය මුදාහරින්නේ නැත. ඒවාට මිලක් ගෙවිය යුතු වේ. කර්මාන්ත අවශ්‍යතාවලට ජල අලෙවිය පහසු වනු ඇත. පානීය ජලය සඳහා ද එසේ ය. ක්‍රියාවලියේ දුෂ්කරම කටයුත්ත වනු ඇත්තේ, කෘෂි කර්මාන්තයට ජලය නිකුත් කිරීම වෙනුවෙන් මිලක් අය කිරීමේදී ය.

උදාහරණයක් ලෙස ඉඩම් අක්කරයක් වගා කිරීමට ජලය අක්කර අඩි 4.5ක් අවශ්‍ය වේ. එය ලීටර 12,34,420ක් පමණ වේ. ලීටරයක් ශත 01 බැගින් මිල කළ ද, අක්කරයක් සඳහා රුපියල් 12,344.00කට ආසන්න මුදලක් ලෙසින් අක්කර එකක් සඳහා අවශ්‍ය ජලය අක්කර අඩි 4.5ක් සඳහා ආසන්න වශයෙන් රුපියල් 50,000.00කට ආසන්න මුදල් ගෙවීමට සිදු වනු ඇත.

'යළි පුබුදමු ශ්‍රී ලංකා' වැඩසටහන තුළ ළිං ජලය සඳහා ද බද්දක් ගෙවීමටත්, ඒ සඳහා කටයුතු කිරීමට අධිකරණ පද්ධති පවා යෝජනා විය. නව පනත් කෙටුම්පත තුළ දැනට එවැන්නක් නොමැති වුව ද, ක්‍රියාවලිය දිගහැරෙනුයේ, ඒ දිශාවටම බව පැහැදිලි ය. යෝජිත ප්‍රතිපත්තිය පහත සඳහන් වන කරුණු නවයක් ඔස්සේ පෙළගස්වනු ලැබ තිබේ.

1. හැඳින්වීම.
2. ජල සම්පත්වල වර්තමාන තත්ත්වය ආශ්‍රිත නිරීක්ෂණ.
3. සාධාරණීයකරණය.
4. විෂය පථය.
5. ප්‍රතිපත්ති මූලධර්ම.
6. ප්‍රතිපත්ති ප්‍රකාශනය: (i) රාජ්‍යයේ සහ රජයේ වගකීම සහ කාර්යභාරය. (ii) ප්‍රතිලාභීන්ගේ වගකීම සහ කාර්යභාරය. (iii) ජල අයිතිවාසිකම් සහ වගකීම්. (iv) ප්‍රශස්ත අයුරින් ජල සම්පත් සැලැසුම් කිරීම. (v) අවශ්‍යතා සහ ප්‍රමුඛතා පදනම යටතේ ජල පරිමාවන් වෙන් කිරීම. (vi) ජල සම්පත් ආශ්‍රිත යටිතල පහසුකම් සංරක්ෂණ, නඩත්තු සහ කළමනාකරණ පිරිවැය පාර්ශ්වකරුවන් අතර භාවිත කිරීම හෝ වෙනත් එකඟ විය හැකි ක්‍රමවේද මඟින් බෙදා ගැනීම. (vii) දත්ත සහ තොරතුරු කළමනාකරණය සහ පාර්ශ්වකරුවන් අතර දත්ත හුවමාරුව. (viii) පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්. (ix) පුද්ගල සහ පුද්ගල ධාරිතා සංවර්ධනය.
7. ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපායයන්.
8. ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස ආයතනික සැකැස්ම.
9. නව ගංගා ද්‍රෝණි කළමනාකරණ ක්‍රමෝපායයන්.

# මානව පරිණාමය පිළිබඳ නූතන



## හෝමෝ (Homo)

ලතින් භාෂාවෙන් 'හෝමෝ' යන වචනයෙන් 'මානවයා' යන අදහස ලබාදෙයි. යම් ජීවියකු 'හෝමෝ' නම් ගණයට අයත් වීම සඳහා සපුරා තිබිය යුතු සීමාවන්, එසේත් නැතිනම් යම් ජීවියකු 'හෝමෝ' ගණයට අයත් යැයි හඳුනාගත හැකි ලක්ෂණ සම්බන්ධව අද වන තෙක් අවසන් අදහසක් නොමැත. කාල් ලිනේයස් විසින් ජීවීන්ගේ විද්‍යාත්මක නාමකරණය සඳහා ද්විපද නාමකරණය හඳුන්වා දෙන අවධියේ (18 වන සියවසේ) විද්‍යාඥයන් විශ්වාස කළේ 'හෝමෝ' ගණයට අයත් වන්නේ නූතන මානවයා පමණක් බවත්, ඒ නිසා හෝමෝ ගණය සඳහා තිබිය යුතු ලක්ෂණ පිළිබඳ නොසලකා සිටිය හැකි බවත්ය. එහෙත්, පසුකාලීනව නියැන්ඩර්තාල් මානව පොසිල සොයාගැනීමත් සමඟ මෙම තත්ත්වය වෙනස්වූ අතර, එතැන් පටන් තවත් ජීවී විශේෂ ගණනාවක් 'හෝමෝ' ගණයට ඇතුළත් කර ඇත.

මානවයා මෙන් දෙපයින් ගමන් කළ ජීවීන් අදින් වසර මිලියන 4කටත් පෙර සිටි බවට සාක්ෂි පවතී. ටැන්සානියාවේ 'ලැටෝලි පා සලකුණු' අදින් වසර මිලියන 3.7ක් පමණ පැරණිය. ගල් ආයුධ භාවිත කිරීම පිළිබඳ සාක්ෂි අදින් වසර මිලියන 3ටත් එපිට කාලයක් දක්වා දිව යයි. එම කරුණු එසේ වුවත්, 'හෝමෝ' යන නාමකරණය අදට භාවිත වන පැරණිම මානව විශේෂ බිහිව ඇත්තේ අදින් වසර මිලියන 3ත් 2.5ත් අතර කාල පරාසයේදීය. එසේ බිහිවූ 'හෝමෝ' ගණයට අයත් මානව විශේෂ මුලින්ම මිහිමත දක්නට ලැබුණේද අප්‍රිකානු මහාද්වීපය තුළය. ඒ අනුව හෝමෝ හැබිලිස්, හෝමෝ රුඩොල්ෆෙන්සිස් ආදීන් අප්‍රිකානු කලාපයටම සීමාවූ අතර, හෝමෝ ඉරෙක්ටස් යනු ප්‍රථම වරට අප්‍රිකානු කලාපයේ සිට අනෙකුත් මහාද්වීප කරා පැතිර ගිය මානව විශේෂය ලෙස සැලැකේ. කෙසේ නමුත්, 'හෝමෝ' ගණයට අයත් උප විශේෂයක් ලෙස අද මිහිමත ඉතිරි වී ඇති එකම එක උප විශේෂය හෝමෝ සේපියන් සේපියන් වේ.

## ***LD***350-1

2013 ජනවාරි මස 29 වන දින ඉතියෝපියානු විද්‍යාඥ චලාචෙව් සියෝම් විසින් සොයාගන්නා ලද LD350-1 ලෙස නම් කරන ලද පොසිලය යනු 'හෝමෝ' ගණයට අයයත් මෙතෙක් සොයාගෙන ඇති පැරණිතම පොසිලය ලෙස සැලැකේ. කාල නිර්ණවලට අනුව මෙම පොසිලය අදින් වසර මිලියන 2.75-2.8 පමණ පැරණි මානව පවුලේ සාමාජිකයකුට අයත් වූවකි. මෙය අයත් වන්නේ හෝමෝ හැබිලිස් විශේෂයටද, එසේත් නැතහොත්, හෝමෝ රුඩොල්ෆෙන්සිස් විශේෂයටද, එසේත් නැතහොත්, මෙතෙක් හඳුනා නොගත් නව හෝමෝ විශේෂයකටද යන්න මෙතෙක් තීරණය කර නැත. කෙසේ නමුත්, දැනට සොයාගෙන ඇති සාක්ෂි අනුව හෝමෝ ගණයට අයත් පැරණිතම සාමාජිකයන් වන හෝමෝ හැබිලිස් සහ හෝමෝ රුඩොල්ෆෙන්සිස් මිහිමත වාසය කර ඇති බවට සැලැකෙන්නේ මීට වසර ලක්ෂ ගණනකට පසුව වන බැවින් මානව පරිණාමය සම්බන්ධයෙන් මෙතෙක් නොවිසැඳුණු ගැටලු නිරාකරණය කිරීමට මෙම පොසිලය බොහෝ සෙයින් වැදගත් වනු ඇත.

LD350-1 යනු ඉතියෝපියාවේ අෆාර් කලාපයෙන් සොයාගන්නා ලද මානවයකුගේ යටිහනුවකි. එය සමකාලීන ඔස්ත්‍රෙලෝපිතකස් විශේෂයන්ට වඩා වෙනස් වන ප්‍රධාන හේතුවක් වන්නේ මානවයන්ගේ මෙන් කුඩා චාර්වක දත් පිහිටා තිබීම හේතුවෙනි. එම නිසා ඔස්ත්‍රෙලෝපිතකස් විශේෂයක සිට හෝමෝ ගණය දක්වා පරිණාමයේ අතරමැදි අවස්ථාවක සිටි මානවයකුගේ පොසිලයක් ලෙස මෙය සැලැකේ.



***LD***350-1 පොසිලයේ ආකෘතිය








වසර මිලියන 2.6 ක් පැරණි ගල් ආයුධ

කෙන්යාවේ ටුර්කානා ජලාශය ආශ්‍රිතව හමුවූ අදින් වසර මිලියන 2.7-3ක් පැරණි KNM-ER5431 පොසිලයද මෙම විශේෂයට අයත් යැයි සැලැකේ. මෙම පොසිල සොයා ගැනීමත් සමඟ ඔස්ත්‍රෙලෝපිතකස් ගාර්හි මඟින් මානවයා පරිණාමය වන්නට ඇතැයි යන මතය බිඳී ගොස් ඇත. මන්දයත්, දැනට පවතින සාක්ෂි අනුව ඔස්ත්‍රෙලෝපිතකස් ගාර්හි මිහිමත වාසය කරන ලද්දේ මීට වසර ලක්ෂ 1-2කට පමණ පසුය.

LD350-1 අයත් මානව විශේෂය විසින් නිපදවනු ලැබුවා යැයි සැලැකෙන වසර මිලියන 2.6ක් පමණ පැරණි ගල් ආයුධද විද්‍යාඥයෝ මේ වන විට සොයාගෙන ඇත. එසේ තියුණු ගල් ආයුධ නිපදවීමට හැකියාව තිබීම නිසා මොවුනට සමකාලීන ඔස්ත්‍රෙලෝපිතකස් විශේෂයන්ට වඩා වෙනස් ආහාර රටාවක් පවතින්නට ඇතැයි විශ්වාස කෙරේ. දත්වල විශාලත්වයේ වෙනස්කම්ද ඊට බලපාන්නට ඇත. එමෙන්ම ඔස්ත්‍රෙලෝපිතකස් විශේෂයන් ජීවත්වීමට කැමැතිවූ පරිසරයට වඩා වියලි පරිසරවල මෙම මානවයන් ජීවත්වන්නට ඇතැයි ද විශ්වාසයක් පවතී.



හෝමෝ හැබිලිස් (නිර්මිත රුවක්)



හෝමෝ හැබිලිස් හිස් කබල


## හෝමෝ හැබිලිස් (Homo Habifi)

# ගවේෂණ

## 04 වන කොටස - (පසුගිය කලාපය හා සම්බන්ධයි)



හෝමෝ හැබිලිස් විශේෂයට අයත් පොසිල ජොනතන් ලීකි විසින් 1960දී ටැන්සානියාවේදී ප්‍රථම වරට සොයාගන්නා ලදැයි සැලැකේ. කෙසේ වුවත්, ඉන් වසරකට පෙර, එනම් 1959දී ජොනතන්ගේ දෙමාපියන්වූ ලුයිස් ලීකි සහ මේරි ලීකි විසින් සොයාගෙන තිබූ පොසිලයක්ද හෝමෝ හැබිලිස් විශේෂයට අයත් වූවක් යැයි පසුව නිර්ණය කර ඇත. (පැරැන්ත්‍රොපස් බොයිසෙයි පොසිල ප්‍රථම වරට සොයාගෙන තිබුණේද මොවුන් විසිනි). මෙම පොසිල සොයාගත් මුල්කාලයේදී ඒවා ඔස්ත්‍රෙලෝපිතකස් අප්‍රිකානුස් විශේෂයට අයත් යැයි විද්‍යාඥයන් විසින් උපකල්පනය කර තිබූ අතර, ඊට මූලික




හේතුව වූයේ මානවයා පරිණාමය වූයේ ආසියාව ආශ්‍රිතව යැයි එවකට විද්‍යාඥයන් විශ්වාස කිරීම නිසාය.

ලතින් භාෂාවෙන් දක්ෂ, හැකියාවන් සහිත ආදී අර්ථ සහිතව හැබිලිස් යන නාමය මෙම විශේෂයට යොදා තිබේ. නැගෙනහිර සහ දකුණු අප්‍රිකාව පදනම් කරගත් වාසභූමි තුළ හෝමෝ හැබිලිස් වාසය කර ඇති බවට සාක්ෂි ලැබී ඇත. කෙන්යාව, ටැන්සානියාව, දකුණු අප්‍රිකාව සහ ඉතියෝපියාව යන රටවල් ආශ්‍රිතව හැබිලිස් විශේෂයට අයත් පොසිල බොහෝ සෙයින් හමුව තිබේ. මෙම කලාපය ආශ්‍රිතව අදින් වසර මිලියන 2.3ට පමණ පෙර බිහිවන්නට ඇතැයි විශ්වාස කෙරෙන මෙම මානව විශේෂය අදින් වසර මිලියන 1.6කට පමණ පෙර මිහිමතින් තුරන්ව ගොස් ඇත.

මෙම විශේෂයට අයත් මානවයකුගේ කපාල ධාරිතාව ආසන්න වශයෙන් ඝන සෙ.මී. 600 - 650ක් පමණ වේ. මෙය ඔස්ත්‍රෙලෝපිතකස් විශේෂයන්ට සාපේක්ෂව ඉහළ අගයක් වන අතර, එම වැඩිවීම තුළ මොළයේ මස්තිෂ්කය කොටස ඔස්ත්‍රෙලෝපිතකස් විශේෂවලට සාපේක්ෂව වැඩි වශයෙන් පැතිරීමක් දක්නට හැකිය. සුළු වශයෙන් නළලක් දැකිය හැකිය. පූර්ව විශේෂවලට වඩා කෙටි හොම්බක් සහිත විය. එසේම විශාල එහෙත්, සාපේක්ෂව සනකමින් අඩු හිස්කබලක් හැබිලිස් සතු විය. එමෙන්ම ඔවුන්ගේ ඉදිරිපස දත් විශාලවූ අතර, පිටුපස දත් පසුකාලීන මානවයන්ගේ මෙන් කුඩා විය. වත්මන් මානවයාගේ දත්වල පිහිටීම U ආකාර වුවද, හැබිලිස්ගේ එය V ආකාර විය.

මෙම විශේෂයේ මානවයන්ගේ ශරීර හැඩය බොහෝ සෙයින් වානරයන්ට සමාන විය. පාදවලට සාපේක්ෂව දිගු අත් ඔවුන් සතු විය. සිය දෛනික ජීවිතය තුළ ශාක මත කාලය ගතකිරීමට ඔවුන් පුරුදුව සිටින්නට ඇති බව විද්‍යාඥයන්ගේ අදහසයි. හැබිලිස්ගේ අත්වල ඇඟිලි යමක් හොඳින් ග්‍රහණය කිරීමට සහ හැසිරවීමට හැකි ආකාරයට මානවයන්ගේ මෙන් සැකැසී තිබී ඇත. එහෙත්, එම ඇඟිලි තවදුරටත් සිවුපා වානරයන්ගේ ඇඟිලිවල හැඩයට සමාන විය.

හෝමෝ හැබිලිස් විශේෂයේ පුරුෂ මානවයන් ස්ත්‍රීන්ට වඩා සාපේක්ෂව ශරීරයෙන් විශාල විය. සාමාන්‍ය පුද්ගලයකුගේ උස අඩි 3යි අඟල් 4 පමණ සිට අඩි 4 දක්වා විය. එසේම ශරීර බර සාමාන්‍යයෙන් කිලෝ ග්‍රෑම් 35 - 40ක් පමණ වන්නට ඇතැයි විශ්වාස කෙරේ. එසේම ඝන රෝම තට්ටුවකින් ඔවුන්ගේ සම වැසී පැවතී ඇත්තේ, සීතල දේශගුණික තත්ත්වයන්ට මුහුණ දිය හැකි ආකාරයටය. එසේම හැබිලිස් වැඩිවියට පත්වීම වත්මන් මානවයාට සාපේක්ෂව වේගයෙන් සිදුවන්නට ඇති බවට මතයක් පවතී.

ස්වාභාවික පරිසරයෙන් සොයා ගන්නා ලද ගල් ආයුධවලට අමතරව තමන් විසින් මුවහත් තල පිහිටන ලෙස නිපදවූ ගල් ආයුධද හෝමෝ හැබිලිස් භාවිත කර ඇත. එක් ගලකින් තවත් ගලකට පහරදී පතුරු ගැලවීමෙන් මුවහත් ආයුධ නිපදවිය හැකි බව හැබිලිස් දැන සිට ඇත. එලෙස භාවිත කළ බවට සාක්ෂි ලෙස ආයුධ භාවිතාවේදී අත්වැරදීම් නිසා තමන්ටම සිදුවූ අනතුරුවල කැළැල් සහිත පොසිල හමුව ඇත. මුවහත් කරන ලද ගල් ආයුධ නිපදවූ ප්‍රථම මානව විශේෂය ලෙස කලක් තිස්සේ හෝමෝ හැබිලිස් සලකනු ලැබුවද, හැබිලිස් බිහිවූවා යැයි සැලැකෙන කාලයට වඩා වසර ලක්ෂ ගණනකට පෙර මුවහත් කර සාදන ලද ගල් ආයුධ හමුවීමත් සමඟ එම නිගමනය තරමක් දුරට බොඳව ගොස් තිබේ. තවද, ලී දඬු ද සිය මෙවලම් ලෙස හැබිලිස් භාවිත කර ඇත. කෙසේ නමුත්, හැබිලිස් සිය ආහාර වෙනුවෙන් දඩයමේ ගිය බවට සැලැකිය හැකි කරුණු නොමැත.

පලතුරු, ශාක පත්‍ර, පැළෑටි මෙන්ම මාංශ වර්ගද හැබිලිස් ආහාරයට ගෙන ඇත. එහෙත් තද ඇට වර්ග හෝ වියළි මස් ආහාරයට ගෙන නැති බවට විද්‍යාඥයෝ විශ්වාස කරති. එසේම මූලික වශයෙන් තණබිම් ආශ්‍රිතව ඔවුන් තම ජීවිත කාලය ගතකර ඇත. ආයුධ භාවිතාවත්, ඒ හා සමග නව ආහාර රටාවලට පුරුදු වීමත් නිසා වියළි මෙන්ම ශීත දේශගුණ තත්ත්වයන් යටතේ පැවැත ඒමට හැබිලිස්ට හැකියාව ලැබී ඇත.

දියුණු භාෂාවක් නොතිබුණද, එකිනෙකා අතර අදහස් සන්නිවේදනය කර ගැනීමේ හැකියාවක් හැබිලිස් සතු වන්නට ඇතැයි සමහර විද්‍යාඥයෝ මත පළ කර ඇත. අනතුරු හැඟවීම්, ආහාර, ගල් ආයුධ නිපදවීම් ආදී කරුණු සඳහා එසේ සරල අදහස් හුවමාරුවක් සිදුවන්නට ඇත. එසේම සමහර වානර විශේෂ, ඔස්ත්‍රෙලෝපිතකස් විශේෂයන්ට වෙනස් ලෙස එක් පිරිමියෙක් සහ ස්ත්‍රී කණ්ඩායමක් වශයෙන් නොව, පිරිමින් කිහිප දෙනකු සිටින විශාල කණ්ඩායම් වශයෙන් ඔවුන් වාසය කර ඇති බවට මත පවතී. තමන් දඩයම් කිරීමට පැමිණෙන සතුන් වෙත කණ්ඩායමක් ලෙස ගල් මුල් විසිකරමින් ආරක්ෂා වීමට ඔවුන් පුරුදුව සිටින්නට ඇත.

හෝමෝ හැබිලිස් මිහිමත විසූ කාලය තුළ ඔස්ත්‍රෙලෝපිතකස් අප්‍රිකානුස්, ඔස්ත්‍රෙලෝපිතකස් සෙඩිබා, පැරැන්ත්‍රොපස් බොයිසෙයි, පැරැන්ත්‍රොපස් රොබස්ටස් මෙන්ම මානව විශේෂ ලෙස හෝමෝ රුඩොල්ෆෙන්සිස්, හෝමෝ අර්ගාස්ටර්, හෝමෝ ඉරෙක්ටස් ආදී බොහොමයක් අසල්වැසියන් ලෙස ජීවත්වන්නට ඇත. ඉන් සමහර විශේෂ සමග වසර ලක්ෂ ගණනක් ගතකර ඇත. පැරැන්ත්‍රොපස් බොයිසෙයි භාවිත කර ඇත්තේ හෝමෝ හැබිලිස් විසින් මුවහත් කරන ලද ගල් ආයුධ යැයිද මතයක් පවතී.

07 පිටුවට




# G 20 සමුළුව මත වැටුණු මෝදිගේ දේශපාලන සෙවණැල්ල

G 20 නවදිල්ලි සමුළුව, 20 කණ්ඩායමේ 18 වැනි සමුළුව පැවැත්වුණේ පසුගිය සැප්තැම්බර් 9-10 දිනවල දීය. මඳක් පමා වුවත්, ජී 20 සමුළුව පිළිබඳ දේශපාලන කියැවීමකට ප්‍රමාදයක් නොමැත්තේ, එය ඉන්දියාවේ අනාගත දේශපාලනය සමඟ සජීවී සම්බන්ධයක් ඇති නිසා ය. 2024 ජුනි 16 වැනි දිනෙන් වත්මන් ඉන්දියානු ලෝක් සභාවේ (පාර්ලිමේන්තුවේ) කාලය නිම වේ. එනම්, එළැඹෙන වසරේ අප්‍රේල්-මැයි කාලය අතරතුර ඉන්දියානු මහා මැතිවරණය පැවැත්වීමට නියමිතය. විචාරකයන්ගේ අදහස අනුව ජී 20 සමුළුවක් පළමු වරට පැවැත්වීමට ඉන්දියාව සත්කාරකත්වය දරන්නේ මේ දේශපාලන සන්දර්භය තුළ ය. ඉන්දියාව විසින් අත්පත් කරගනිමින් සිටින ගෝලීය භූමිකාව ප්‍රදර්ශනය කිරීමත්, එය පෙරළා රට තුළ මෝදිගේ දේශපාලන අනාගතයට ආයෝජනයක් කර ගැනීමත් එක විට සිදු වී තිබේ.

ජී 20 සමුළුව නමින්ම ප්‍රකාශ වන පරිදි රටවල් 20ක එකතුවක් වුව ද, සමුළුව පැවැති හා ආසන්න කාලය තුළ නවදිල්ලිය පුරා ප්‍රදර්ශනය කෙරුණේ මෝදිගේ මුහුණය. එසේම මෝදි අගමැතිවරයාගේ පාලනය තුළ ඉන්දියාව තුළ ඉස්මතු කෙරෙමින් ඇති හින්දුත්වය ප්‍රමුඛ කර ගත් ජාතිකවාදී මුහුණුවරය.

සමුළුව වෙනුවෙන්ම ගුවන්තොටුපළේ අලුතෙන් ඉදිකරන ලද දැවැන්ත ශාලාවේ පමණක් නොව අගනුවර සෑම පාරකම පාහේ අඩි 20කට වරක් මෝදිගේ මුහුණු ජනතාව දෙස බලා සිටියේය. මුළු නගරයම සමුළුව වෙනුවෙන් සරසා තිබූ අතර, වීදි වෙළෙන්දන් අතුරුදහන් කරවා තිබුණා පමණක් නොව නගරයේ වීදිවල දඩාවතේ යමින් සිටි බල්ලන් මේ කාලය තුළ පවා බැඳ දමනු ලැබ තිබූ බවත් වාර්තා විය.

සමුළු ශාලාවේ මෝදිගේ භාරතීය ජනතා පක්ෂයේ ලාංඡනය කැපී පෙනෙන ලෙස ප්‍රදර්ශනය කර තිබුණේ එළැඹෙන වසරේ මැතිවරණය තෙක් තැබීමට විය හැකිය. දැවැන්ත සම්මන්ත්‍රණ ශාලාව 'භාරත් මණ්ඩපම්' ලෙස නම් කර තිබිණි. ඒ, පැරණි ඉන්දියාවට සංස්කෘත භාෂාවෙන් භාවිත වූ 'භාරත්' යන නාමය සහ හින්දු කෝවිල්වල කොටසක්වූ 'මණ්ඩපය' සහිතව ය. තවදුරටත් ඉන්දියාව මෙතෙක් පැවැති අනාගමික රාජ්‍යය නොවේ. සමුළු ශාලාවේ සවි කර ඇති දැවැන්ත දැන්වීම් පුවරුවල සෑම තැනම පාහේ ප්‍රදර්ශනය කර තිබුණේ නෙළුම් මල සහිත දර්ශනයන් ය. ඒ, හුදු ඉන්දියාවේ ජාතික පුෂ්පය ලෙස පමණක් නොවේ; භාරතීය ජනතා පක්ෂයේ සලකුණ ලෙසය. ජී 20 සමුළුවේ නිල ලාංඡනය ද සැදුම් ලද්දේ එයිනි.

ශාලාවේ බිත්තිවල සවිකර තිබූ යෝධ ඩිජිටල් තිර මත ප්‍රදර්ශනය වෙමින් තිබුණේ, යුනෙස්කෝ ලෝක උරුමයක්වූ ද, 14 වැනි සියවසේ විජයනගර හින්දු අධිරාජ්‍යයේ අගනුවර ලෙස පැවැතියාවූ ද හැම්පි නගරයේ සහ තවත් පැරණි හින්දු කෝවිල්වල වීඩියෝ දර්ශන ය.

සමුළුවට අදාළ මෝදිගේ දේශනයේදී සහ බොහෝ මාධ්‍ය හමුවලදී ඉන්දියාව ලෝකයේ විශාලතම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය ලෙසටත්, ගෝලීය දකුණේ හඬ ලෙසටත් පුන පුනා විස්තර කරනු ලැබීය. ඒ සමුළුවේ තේමාව 'එක් ලෝකයක්, එක් පවුලක්, එක් අනාගතයක්' වී තිබියදීය. මෝදි යටතේ ඉන්දියාව පුරා පුපුරා යමින් ඇති ජාතිවාදී ගැටුම් හෝ ඒවායේ වින්දිතයන් පිළිබඳව කිසිවක් ඒවායේ සඳහන් වූයේ නැත.

# ලෝක ජනමතය කියුබාව සමඟ

පසුගිය ඔක්තෝබර් 26 වැනි දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය වෙත ඉදිරිපත්වූ කියුබාවට එරෙහි එක්සත් ජනපද ආර්ථික සම්බාධකවලට එරෙහිව වාර්ෂිකව ඉදිරිපත් කරනු ලබන යෝජනාවට පක්ෂව අතිමහත් බහුතර රටවල ඡන්දය ප්‍රකාශ වී තිබේ. එම යෝජනාවට පක්ෂව ඡන්ද 187ක් ලැබී ඇති අතර, එරෙහි වී ඇත්තේ එක්සත් ජනපදය සහ ඊශ්‍රායලය පමණි. යුක්රේනය හුදෙකලාව ඡන්දය දීමෙන් වැළකී සිටියේ මේ මොහොතේ අත්‍යවශ්‍ය වී ඇති එක්සත් ජනපද ආධාර නොලැබී යාමේ අවදානම නිසා විය හැකිය.

මෙම යෝජනාව වසර 31ක කාලයක් පුරා ඉදිරිපත් කරන්නක් වන අතර අතර, වසරින් වසර සම්බාධක ඉවත් කිරීමට පක්ෂව ලැබෙන ඡන්ද සංඛ්‍යාවේ ඉහළ යාමක් දැකිය හැකි විය. මෙම වසරේ අවසන් ප්‍රතිඵලය අතිශය තීරණාත්මක බව පෙනී යන්නේ පසුගිය වසරේ ඡන්ද ප්‍රතිඵලය සමඟ සැසඳීමේදීය. පසුගිය වසරේ යෝජනාවට එරෙහිව රටවල් 03ක් ඡන්දය ප්‍රකාශ කර තිබූ අතර තවත් රටවල් 03ක් ඡන්දය දීමෙන් වැළකී සිට තිබිණි.

මේ ඡන්ද ප්‍රතිඵලය මහා මණ්ඩලය සැසිය හමුවේවූ තිරයේ ප්‍රදර්ශනය වූයේ බොහෝ නියෝජිතයන්ගේ දෑත්වලින් පුපුරා යන අත්පොළසන් හඬ මධ්‍යයේය. ඡන්ද විමසීමට පෙර සභාව ඇමතූ කියුබානු විදේශ කටයුතු අමාත්‍ය බෲනෝ රොඩ්‍රිගුස්, කියුබාවට එරෙහි සම්බාධක සියලු කියුබානු ජනතාවගේ ජීවත්වීමේ, සෞඛ්‍ය පහසුකම් ලැබීමේ, අධ්‍යාපනය ලැබීමේ අයිතිය, යහපැවැත්ම උල්ලංඝනය කිරීමක් ලෙස හැඳින්වීය. ඔහු සම්බාධක 'සාමකාමී කාලයක යුද්ධය හැසිරීමක්' ලෙස හඳුන්වාදී තිබිණි.

1962 වසරේ එක්සත් ජනපදය විසින් පනවන ලද ආර්ථික, මූල්‍ය හා වෙළෙඳ සම්බාධක මඟින් කියුබාවට ඩොලර් මඟින් ගනුදෙනු කිරීම, එක්සත් ජනපදය ඔස්සේ ගෙන එනු ලබන, එක්සත් ජනපද මූල්‍ය පද්ධතිය භාවිත කරන ලද සහ එක්සත් ජනපදයේ නිපදවන ලද උපාංග 10%කට වැඩියෙන් භාවිත කරන ලද නිෂ්පාදන මිලදී ගැනීම ඇතුළු ක්‍රියාමාර්ග රැසක් තහනම් කරනු ලැබ තිබේ. කියුබානු විදේශ අමාත්‍යවරයා මහා මණ්ඩලය හමුවේ තබන ලද වාර්තාවට අනුව මෙම එක්සත් ජනපද සම්බාධක හේතුවෙන් 2022 මාර්තු සිට 2023 පෙබරවාරි දක්වාවූ වසරක කාලය තුළ කියුබාවට සිදුවී ඇති ඇස්තමේන්තුගත අලාභය ඩොලර් මිලියන 4,867කි.

කියුබාව වෙනුවෙන් අදහස් දක්වන ලද බොහෝ රටවල් එක්සත් ජනපදයේ සමීප සහායකයන් වුව ද, සම්බාධක පැනවීම විවේචනය කළේ එය එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය විසින් අනුමත නොකරන ලද, අනෙක් රටවලට මැදිහත්වීමක් සිදුකරන, ඒකපාර්ශ්වීය තීරණයක් ලෙසට ය. එමඟින් කියුබානු ආණ්ඩුවට වෙනුවට කියුබානු ජනතාවට දඬුවම් කරන බව ඔවුන්ගේ අදහස විය.

මෙම මහා මණ්ඩල යෝජනා සම්මතයෙහි සංකේතාත්මක වටිනාමක් හැරෙන්නට නෛතික බැඳීමක් නැති අතර මේ දක්වා කියුබාව කෙරෙහිවූ එක්සත් ජනපද ප්‍රතිපත්තියේ වෙනසක් කරලීමට ද සමත් වී නැත.

07 පිටුවට

## මානව පරිණාමය පිළිබඳ .......

04-05 - පිටුවෙන්

කෙසේ නමුත්, හෝමෝ හැබිලිස් බිහිවූයේ කුමන විශේෂයක් පරිණාමය වීමෙන්ද යන්න නිවැරැදිව කිව හැකි කරුණු අදටත් නොමැත. ඔස්ත්‍රෙලෝපිතකස් ඇෆරන්සිස්, ඔස්ත්‍රෙලෝපිතකස් ගාර්හි ආදී විශේෂ හරහා හැබිලිස් බිහිවන්නට ඇතැයි පෙරදී විශ්වාස කළද LD350-1 පොසිල හමුවීමත් සමග එම අදහස්ද ව්‍යාකූල වී තිබේ. එමෙන්ම හෝමෝ අර්ගාස්ටර් සහ හෝමෝ ඉරෙක්ටස් බිහිවූයේ හැබිලිස්ගේ පරිණාමීය ප්‍රතිඵලයක් ලෙස බව මීට දශක කිහිපයකට පෙර විශ්වාස කළද, එයද අද වෙනස්වී ඇත්තේ ඒ පිළිබඳ නිවැරැදි මතයක් තවදුරටත් තහවුරු නොකරමිනි. එම නිසා වත්මන් මානවයාගේ අතීත පුරුකක් ලෙස හෝමෝ හැබිලිස් සැලැකිය හැකිද යන්න නිශ්චිත ලෙස කිව නොහැකිය. හෝමෝ ඉරෙක්ටස් දඩයමේ යමින්, වාසස්ථාන සාදා ගනිමින්, ගින්දර භාවිත කරමින් සිටින කාලය අතරතුර, එනම් අදින් වසර ලක්ෂ 16කට පමණ පෙර හෝමෝ හැබිලිස් මිහිමතින් තුරන්ව ගොස් ඇත.

තවත් කොටසක් ඉදිරි කලාපයෙන් බලාපොරොත්තු වන්න

## මාර්ග ගත ක්‍රමවල .......

02 - පිටුවෙන්

මින් අදහස් කරන්නේ මීට අනුව එම ප්‍රකාශය නිසා ප්‍රකෝපවී කැරැලි ගැසීමක් වුණා යැයි කොමිසම නිගමනය කරන සහ ප්‍රකෝපවී කැරැලි ගැසීමක් සිදු නොවුණා යැයි කොමිසම නිගමනය කළද, මෙම පනත යටතේ එය වරදක් ලෙස ගෙන දඬුවමට ලක් වීමයි.

උදාහරණයක් ලෙස පවතින ආණ්ඩුවේ දූෂණ, වංචා පිළිබඳව සමාජ මාධ්‍ය ජාලයක හෝ වෙබ් අඩවියක යමකු පුවතක් ප්‍රචාරය කළ විට එය මඟින් තව කෙනකු කෝප වුවහොත්, ඒ කෝපයෙන් ඔවුන් එකතුවී ආණ්ඩුවට එරෙහිව විරෝධතා පැවැත්වුවහොත්, ඒ වාගේම විරෝධතා නොපැවැත්වුවත්, එම ප්‍රකාශයෙන් යමකු කෝපයට පත් වුවහොත් සිරදඬුවමකට හෝ මුදල් දඩයකට හෝ ඒ දෙකටම ලක් වීමට සිදු වේ. කිසිදු ස්වාධීනත්වයක් අපේක්ෂා කළ නොහැකි ජනාධිපතිගේ අභිලාෂ ඉටු කිරීම සඳහා මෙහෙයැවෙන මෙවැනි කොමිසමකින් අගතියක්, මර්දනයක් මිස පුරවැසියන්ට කිසිදු සෙතක් සිදු නොවෙයි.

■මෙම පනත් කෙටුම්පතෙහි 16 වන වගන්තියට අනුව ආගමික හැඟීම්වලට රිදවීමේ ඒකායන අරමුණෙන් අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කළහොත්, වසර 02ක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට හෝ ඒ දෙකටම සහ දෙවන වරටත් එම වරද සිදු කළහොත්, එම දඬුවම දෙගුණ කළ හැකිය.

මින් මතුවන ප්‍රකාශනය නම්, ආගමික හැඟීමකට රිදවීම යන්න කෙසේ කොමිසම විසින් වර නඟනවාද යන්න සහ එම රිදවීම ඇතිවූ පුද්ගලයා එය ප්‍රකාශ කරනවාද යන්නයි. එය තීරණය කිරීමේ පූර්ණ බලතල හිමි වන්නේ ජනාධිපති විසින් පත් කරනු ලබන කොමිසමේ සාමාජිකයන්ටය.

උදාහරණයක් ලෙසට දෙවියන් කියා කිසිවකු නොමැති බව යමකුට සමාජ මාධ්‍ය තුළ ප්‍රකාශ කළ හැකිය. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව පුද්ගලයකුට එම අයිතිවාසිකම හිමිය. නමුත්, යම් කිසිවකු පැමිණිලි කළහොත්, දෙවියන් නොමැති බව පැවසූ නිසා ඔහුගේ හෝ ඇයගේ හෝ ආගමික හැඟීමට රිදවීමක් සිදුවූවා කියා එම ප්‍රකාශය සිදුකළ පුද්ගලයා වරදකරුවකු කිරීමට කොමිසමට හැකිය.

### ලෝකයේ රටවල් කිහිපයක පනත් ගෙන ඒමෙන් පසු...

සිංගප්පූරු පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද මාර්ගගත ආරක්ෂණ (විවිධ සංශෝධන සහිත) පනත් කෙටුම්පත මඟින් මාර්ගගත ක්‍රමවලින් සිදුවන හානි, සියදිවි නසාගැනීම් හෝ ස්වයං හානි සිදුකර ගැනීම, ශාරීරික හෝ ලිංගික හිංසනය සහ ත්‍රස්තවාදය මෙන්ම සිංගප්පූරුවේ වාර්ගික හා ආගමික අසමඟිය ඇති කරන කරුණු සඳහා අනුබල දෙන හෝ උපදෙස් සපයන අන්තර්ගතයන් ඇතුළත් 'අසතුටුදායක අන්තර්ගතය' නියාමනය කිරීමට අදහස් කෙරේ. කෙසේ නමුත්, මෙහි යථාර්ථය නම්, මෙමඟින් සිංගප්පූරු ආණ්ඩුවට අන්තර්ජාල භාවිත කරන්නන්ට, පුවත්පත්වලට, විකාශන බලපත්‍රලාභීන්ට, අන්තර්ජාල සේවා සපයන්නන්ට සහ අන්තර්ජාල අතරමැදියන්ට එරෙහිව භාවිත කිරීමට විශාල බලයක් හිමිවීමයි. සිංගප්පූරුව තුළද රජයට එරෙහි පුද්ගලයන් මර්දනය කිරීමට මෙම පනත අවභාවිත කරනු ලබන අතර, එරට ආණ්ඩු විරෝධී සටහන් තැබූ අයට සිදුවූයේ කුමක්ද යන්න ගැන හෝ කිසිදු තොරතුරක් නොමැත.

2022 වසරේ සිට පකිස්ථානය තුළ මෙම නීතිය හඳුන්වා දෙනු ලැබුවා. එය PECA (Pakistan Electronic and Communication Act) යන නමින් හඳුන්වනු ලබන අතර, එය ගෙන එන මුල් අවස්ථාවේ මෙම නීතියට දැඩිසෙයින් පක්ෂ වූවෝ එරට මාධ්‍යවේදීහුය. නමුත්, අවුරුද්දක් තුළ එරට මාධ්‍යවේදීන් 26 දෙනකු මෙම නීතිය යටතේ අත්අඩංගුවට ගෙන සිරගත කරනු ලැබූ අතර, තවමත් කිහිප දෙනෙක් සිරභාරයේ සිටිති.

මැලේසියාව තුළද මෙම නීතිය සම්මතවී තිබෙන අතර, එරට තුළ පළමුවෙන්ම සිදුකරනු ලැබුවේ එරට රජය දැඩිව විවේචනය කළ 'මැලේෂියාකින්' නම් වෙබ් අඩවියට ඩොලර් 1,25,000ක දඩයක් නියම කිරීමයි.

### මෙහි සැබෑ අරමුණ නම්

අවුරුදු 75ක් මුළුල්ලේ ගෙනගිය එකම දේශපාලන, ආර්ථික වැඩපිළිවෙළේ දිගුවක් රනිල් රාජපක්ෂ ආණ්ඩුව තවදුරටත් ක්‍රියාත්මක කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස අපේ රට බංකොළොත් රාජ්‍යයක් බවට මේ වන විට පත්ව තිබේ. ආණ්ඩුව සුපුරුදු පරිදි විසඳුම ලෙස 'අයි.එම්.එෆ්.' (IMF) වැඩපිළිවෙළ තෝරාගෙන තිබෙන අතර, එය කිසිසේත් ජනතාවාදී විසැඳුමක් නොවන බව අපි කවුරුත් දන්නෙමු. එබැවින්, මෙම ක්‍රියාවලිය මත ජනතාවට සහන දෙනවා වෙනුවට ආණ්ඩුව තව තවත් ඔවුන් පීඩාවට පත්කරමින් සිටී. පීඩාවට එරෙහිව ජනතාවගේ නැඟීසිටීම වැළැක්වීම අරමුණු කරගෙන මෙවැනි පනත් ගෙන එනු ලබයි.

## රජය යනු කුමක්ද? .......

08 - පිටුවෙන්

### රජය සහ ආණ්ඩුව අතර වෙනස

රජය සහ ආණ්ඩුව යනු එකක් නොව දෙකකි. ඒ අතරම මේ ආයතන දෙකම ඒකත්වයක පවතී. රජය සාපේක්ෂ වශයෙන් ස්ථාවර එකකි. එක් රජයක් වෙනුවට අලුත් රජයක් ආදේශ වන්නේ සමාජ විප්ලවයකදීය (උදාහරණයක් ලෙස වැඩවසම් රජය වෙනස්වී ධනපති රජය පැනනැඟීම). ඒ අනුව රජය නිශ්චිත සමාජ, ආර්ථික නිෂ්පාදන මාදිලියකට සම්බන්ධ ස්ථාවර එකකි.

ආණ්ඩුව යනු රජයට සම්බන්ධ උපකරණයකි. එය වෙනස්වනසුලුය. ව්‍යවස්ථාවක් මඟින් නීතිගත කර වසර 4-5ක් වැනි කෙටි කාල රාමුවකට වරක් එය සාමාන්‍යයෙන් වෙනස් වෙයි. රජය සහ ආණ්ඩුව අතර සම්බන්ධයේදී රජය මෙහෙයැවීම සිදුකරන්නේ ආණ්ඩුව විසිනි. එම නිසා මේ දෙක එකිනෙක අනුරූපී විය යුතුය; අරමුණු සමාන විය යුතුය. නැතහොත්, බරපතළ ගැටුම් මතුවෙයි. නිදසුනක් ලෙස ධනපති රජයක් තුළ සමාජවාදී ආණ්ඩුවක් ප්‍රතිවිරෝධී වෙයි. එය ගැටුමකින් තොරව පැවැතීමට නම්, සමාජවාදී ආණ්ඩුවේ අරමුණුවලට අනුරූපව රජයද වෙනස්විය යුතුය. පන්ති අහෝසි වන විට රජයද අහෝසි වෙයි

# රජය යනු කුමක් ද?

සමාජ පරිවර්තක කාර්යයකට (සමාජවාදී විප්ලවයට) සක්‍රියව දායක වී සිටින අප 'රජය' පිළිබඳව ඉතා නිරවුල් අවබෝධයක සිටිය යුතු ය. 'රජය යනු කුමක් ද?', 'එය බිහි වූයේ කෙසේ ද?' 'රජය හැම දා ම පැවැතුණේ ද?', 'ඒ පිළිබඳ මාක්ස්වාදී ස්ථාවරය කුමක් ද?' යන ප්‍රශ්නවලට නිරවුල් පිළිතුරු දැනගත යුතු ය. මේ කෙටි න්‍යායික ලිපිය ඒ සඳහා ප්‍රවේශයකි.

## රජය බිහි වීම පිළිබඳ නිර්මාක්ස්වාදී මත

රජය පිළිබඳව මෙන් ම එය බිහිවීම පිළිබඳව ද ධනේශ්වර දේශපාලන චින්තනය තුළ මත ගණනාවක් තිබේ. 1919 ජූලි 11 වැනි දින ස්වෙර්ද්ලොව් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට 'රජය' පිළිබඳව ලෙනින් ඉදිරිපත් කළ දේශනයක දී ඒ ගැන කියා තිබුණේ ද: "රාජ්‍යය පිළිබඳ ප්‍රශ්නය තරම් ධනපති විද්‍යාව, දර්ශනය, නීති විද්‍යාව, දේශපාලන අර්ථ ශාස්ත්‍රය සහ පුවත් පත් කලාව මඟින් සිතාමතා ම සහ නොදැනුම්වත්ව ම ද ව්‍යාකූල කරන ලද වෙනත් ප්‍රශ්නයක් ඔබට සොයාගත නොහැකි වනු ඇතැයි මම මුලින් කීවෙමි. අද දක්වා ම බොහෝ විට එය ආගම් ප්‍රශ්න සමඟ පටලවනු ලැබේ. ආගමික ධර්මය අදහන අය (ඔවුන් එසේ කිරීමට බලාපොරොත්තු විය හැකි ය.) පමණක් නොව තමන් ආගමික දුර්මතවලින් නිදහස් යැයි සිතන අය පවා රාජ්‍යය දේවත්වයට අයත් දෙයක් යැයි ද, අද්භූත දෙයක් යැයි ද, එය මනුෂ්‍ය අර්ථයට අයත් නැති සහ මිනිසාට පිටස්තරින් දෙන ලද කිසියම් දෙයක් ජනතාවට ප්‍රදානය කරන නැතහොත්, ප්‍රදානය කිරීමට තිබෙන එසේත් නැතහොත්, ගෙන එන දේව සම්භවයක් සහිත බලවේගයක් යැයි ද, එය මිනිස් වර්ගයාගේ පැවැත්මට හේතුභූත වූ කිසියම් බලවේගයක් යැයි ද කියන ධර්මයක් බිහි කිරීමට උත්සාහ කරමින්, රාජ්‍යය හා සම්බන්ධ නිශ්චිත ප්‍රශ්නය ව්‍යාකූල කරති."

I. දේව වරම්වාදය

රජය දෙවියන්ගේ නිර්මාණයක් බව මින් කියැවේ. ඉහත ලෙනින්ගේ ප්‍රකාශය තුළ ද අඩංගු වන්නේ මෙම වැරැදි මතයේ හරයයි.

II. සමාජ සම්මුතිවාදය

සමාජය තුළ රජය බිහි වූයේ මිනිසුන් අතර වූ පොදු සම්මුතියකින් ය යන අදහස මින් කියැවේ. මෙම මතවාදයට අනුව රජය සැමදා පැවැතියේ නැත. රජය නොමැති කාලයක් ද විය. පසුව සමාජයේ ගැටුම් ඇති විය. එය සමනය කිරීමට සම්මුතියක් ලෙස රජය බිහි විය. මේ මතය ඉදිරිපත් කළ දේශපාලන චින්තකයෝ කිහිප දෙනකු වූහ. එම මත අතර වෙනස්කම් ද තිබේ.

- ✧ තෝමස් හොබ්ස් (එංගලන්තය)

  **මිනිසා උපතින් ම ආත්මාර්ථකාමී බව කියයි. රජය සම්මුතියේ කොටස්කරුවකු නොව එහි ප්‍රතිඵලය බව කියන මොහු රජය සර්ව බලධාරී එකක් බවත්, ඊට ජනයා අවනත විය යුතු බවත් කියයි. එමඟින් ඒකාධිපති රජයක පැවැත්ම සාධාරණීයකරණය කර තිබේ.**

- ✧ ජෝන් ලොක් (එංගලන්තය)

  **දේපළ මත සමාජය තුළ ගැටුම් ඇති වූ බවත්, එහි දී මිනිසුන් සහ රජය අතර සම්මුතියක් ඇති වූ බවත් කියයි. රජය සම්මුතියේ කොටස්කරුවෙකි. එනිසා රජය සම්මුතිය කඩ කරන්නේ නම්, එවන් රජයක් පෙරළා දැමීමට ජනතාවට ඇති අයිතිය පිළිගනී.**

- ✧ රූසෝ (ප්‍රංශය)

  **රූසෝ ද ඉහත මතවාදය ම ඉදිරිපත් කරයි. සම්මුතිය ඇත්තේ, සමාජය අතර නිසා රජය සමාජයට වගකිව යුතු ය. රජය පෙරළීමේ ජනතා අයිතිය පිළිගනී.**

මීට අමතරව 'බලවාදය', 'මාතෘ ප්‍රභූත්වවාදය' යන නම්වලින් ද මතවාද ඇති අතර, ඒ සියල්ල වැරැදි මත වේ.

## රජය පිළිබඳ මාක්ස්වාදී මතය

රජය වූ කලී පන්ති ප්‍රතිවිරෝධතාවන්ගේ අසමඟි බවේ ඵලය වේ. (පන්ති අතර අසමඟිය නිසා රජය බිහි වුව ද, රජයේ කාර්යය වන්නේ පන්ති අතර සමාදානය බිහි කිරීම නොව එක් පන්තියක් පාගාගෙන සිටීමට දේපළ හිමි පන්තියට සේවය කිරීමයි. ලෙනින්ගේ 'රජය සහ විප්ලවය' කෘතියේ 9 වැනි පිටුව තුළ එංගල්ස්ගේ උපුටා දැක්වීමක් තුළ මෙම අදහස හොඳින් විස්තර කර තිබේ.


**"රජය මේ නිසා සමාජය මත පිටතින් පැටවූ කිසියම් ප්‍රපංචයක් නොවේ. හෙගල් කියන පරිදි රජය සත්‍යය වූ ආධ්‍යාත්මික අභිප්‍රායයක් නොවන්නා සේ ම බුද්ධි තර්කණයේ තත්විකත්වය හෝ ප්‍රතිමූර්තිය ද නොවන්නේ ය. රජය වූ කලී සමාජ සංවර්ධනයේ ඵලයක් වශයෙන් එක්තරා අවධියක දී පැනනගින්නකි. රජය වූ කලී විසැඳිය නොහැකි ප්‍රතිවිරුද්ධතාවනට ඒ තුළින් ම මේ සමාජය හසු වී ඇති බැව් පිළිගැනීමකි. එමෙන් ම ඒ සමාජය සමඟි කළ නොහැකි වූ ප්‍රතිවිරෝධී පැති දෙකකට බෙදී ගොස් ඉන් ගැලවීමට තරම් ශක්තියක් නොමැතිව අවුල් ජාලාවක් බවට පත් වූ සැටි පිළිගැනීමක් ය. ප්‍රතිවිරෝධී ආර්ථික වුවමනාවන් ඇති පන්තීන්ගේ විරුද්ධතාවන් එකිනෙකා මෙන් ම සමාජය ද ගිල ගැනීමේ නිසරු අරගලයක යෙදීම වැළැක්වීම පිණිස සමාජයට උඩින් සිට ඝට්ටනවල සැර බාල කර 'සාමයේ' පවුරු තුළ තැබීම සඳහා බලවේගයක් අවශ්‍ය විය. සමාජය තුළින් පැනනැංග ද, එයට ඉහළින් සිටගෙන අනුක්‍රමයෙන් සමාජයෙන් ඈත් වෙමින් සිටින ඒ බලවේගය 'රජය' යි."**

මේ අනුව රජය වූ කලී පෑගී සිටින පන්තිය සූරාකෑමේ පන්ති උපකරණය වේ. එයට අනුව රජය ප්‍රතිගාමී වෙයි. එය මර්දනකාරී ආයතනයකි. එය යම් පන්තියක පන්ති ආඥාදායකත්වයකි. ප්‍රාථමික සාමූහික සමාජය බිඳවැටී වහල් හිමි සමාජය බිහිවීමත් සමඟ රජය පැන නැගුණු අතර වැඩවසම් හා ධනේශ්වර නිෂ්පාදන මාදිලියට අනුරූපව රජය ද වෙනස්විය.

## රජයේ ව්‍යුහය
**(රජය සකස් වී ඇති අයුරු)**

රජයේ ව්‍යුහය සකස් වී ඇත්තේ, ආයතන වර්ග කීපයක එකතු වීමෙනි. එනම්, යුද හමුදාව, පොලිසිය, සිරගෙවල්, අධිකරණය සහ නීති පද්ධති, අධිපති පන්තියේ අවශ්‍යතා වෙනුවෙන් ගොඩනගා ඇති නිලධාරීන්... ආදිය මඟින් මෙම ආයතන පද්ධතිය සකස් වෙයි.

07 පිටුවට



"...රාජ්‍ය පොදු බලය නතු කරගෙන, අයබදු පැනවීමේ බලය තමන් සතු කරගෙන සිටින නිලධාරීහු සමාජයේ සංවිධාන සංස්ථාවන් ලෙස දැන් සමාජයට ඉහළින් සිටිති යැයි එංගල්ස් කියයි. ගෝත්‍ර සංවිධානවල තිබූ සිය කැමැත්තෙන් ම ගරු කිරීම ආදිය ඔවුනට දිනා ගැනීමට පුළුවන් වුව ද, ඔවුන්ට එය නොසෑහේ. නිලධාරීන්ගේ පාරිශුද්ධත්වය සහ නිදහස් වරප්‍රසාදාදිය සංස්ථාගත කරමින්, විශේෂ නීති සම්පාදනය විය. අතිශය කිළිටි පොලිස්කාරයාට පවා ගෝත්‍ර සමාජයේ නියෝජිතයාට වඩා 'ආධිපත්‍යයක්' තිබේ. එහෙත්, ශිෂ්ට රජයක යුද බළකායේ ප්‍රධානියකුට වඩා 'බලයෙන් ලබා නොගත්තා වූ' ගෞරවයක් සමාජයෙන් ගෝත්‍ර නායකයකුට ලැබිණි."

**(ලෙනින් රජය හා විප්ලවය - 15/16 පිටු.)**